# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No | 10120 | ෆැක්ස් / தொலைநகல / Fax | 011-2171635 |
| දුරකථන / தொலைபேசி / Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site | www.Police.lk |
| ඊ මේල් / மின்னஞ்சல் / E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My NO | 1052 / 2024 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | / 2024 | දිනය / திகதி / Date | 23/06/2024 පැය 1220 |

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 01 ක් සහ තවත් සැකකරුවන් 21 දෙනෙකු අත්අඩංගුවට - කළුතර, ගාල්ල, මාතර, කොළඹ, බස්නාහිර පළාත් දකුණ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට ගාල්ල අපරාධ කොට්ඨාසය, කොළඹ අපරාධ කොට්ඨාසය හා මාතර අපරාධ කොට්ඨාසය විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම සිදු කර ඇත.

1. 2024.06.22 වන දින ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් තෙල්වත්ත පොලිස් වසමේදී වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන තෙල්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ඉහත අත්අඩංගුවට ගන්නා ලද අපරාධ කල්ලි සාමාජිකයාට අමතරව ඔවුන් සමඟ විවිධ සම්බන්ධතා පවත්වමින් අපරාධවලට සහය දැක්වූ බවට සැක කරන තවත් සැකකරුවන් 21 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. **ඒ අනුව 2024.06.22 වන දින සැකකරුවන් 22 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.06.21 වන දින දක්වා සමස්ත සැකකරුවන් හා සැකකාරියන් 1794 ක් අත්අඩංගුවට ගෙන ඇති අතර,** සංවිධානාත්මක අපරාධ සිදු කිරීම සඳහා සෘජුවම සහය දැක්වීම, අපරාධ සැලසුම් කිරීම හා

එම අපරාධ වලට ආධාර අනුබල දීම ආදී විවිධාකාරයෙන් සහය ලබා දුන් සැකකරුවන් හා සැකකාරියන් මේ අතර වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, මාතර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය මඟින් රැඳවුම් නියෝග ලබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**